
# පාර්ලිමේන්තු විත්ති

**පුවත් හසුන | 27 වැනි කාණ්ඩය | සැප්තැම්බර් 2022**



## මෙතෙක් පාර්ලිමේන්තුව නැරඹීම සඳහා මහජනතාවට පනවා තිබූ සීමාවන් ලිහිල් කෙරේ

කොවිඩ් තත්ත්වය සහ ආරක්ෂක හේතුන් මත මෙතෙක් පැවති පාර්ලිමේන්තුව නැරඹීම සදහා පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීම මේ මස සිට සිදු විය. මේ අනුව පාර්ලිමේන්තු රැස්වීම් නොමැති දිනවලදී පාසැල් ශිෂ්‍යයන් ඇතුළු පාර්ලිමේන්තුව නැරඹීමට ඉල්ලීම් සිදුකරන පාර්ශවයන්ට ඒ සදහා අවසර ලබා දීමට එකඟත්වය පලවී තිබේ.

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව



01

පුවත්

පාර්ලිමේන්තු විදු පියසෙන්

කාරක සභා පුවත්

විශේෂාංග

09



කවරයේ කතාව

පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# අන්තර්ගතය

## කාරක සභා පුවත්

- ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සහභාගීත්වයෙන් පැවති ජාතික සභාවේ මංගල රැස්වීමේදී ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික ස්ථායීකරණයට අදාළ අනුකමිටු දෙකක් පිහිටුවීමට තීරණය කෙරේ.
- අමාත්‍යාංශ ලේකම්වරු තිදෙනෙක් සහ තානාපතිවරයෙකුගේ පත් කිරීම සඳහා උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමතිය.
- ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරයට අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා පත්වෙයි.
- දේශීය සිනමාවේ අභිවෘද්ධිය උදෙසා පාර්ලිමේන්තු කාරක සභාවක් පිහිටුවන්නැයි මන්ත්‍රීවරයන්ගෙන් කථානායකතුමාට ඉල්ලීමක්.
- පාර්ලිමේන්තුවේ සභාපති නාමාවලිය සඳහා මන්ත්‍රීවරයන් නම් කෙරේ.
- සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම සඳහා පාර්ලිමේන්තු සභාවේ අනුමතිය.
- ආර්ථික අර්බුදය පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සකස් කිරීමට රජයේ මුදල් පිළිබද කාරක සභාවේදී යෝජනා වෙයි.
- අමාත්‍යාංශයීය උපදේශක කාරකසභා 09ක් සඳහා සාමාජිකයන් පත් කෙරේ.
- මැයි 9 ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට අදාළ විශේෂ කමිටු වාර්තාව ඉදිරියේදී පාර්ලිමේන්තුවට - ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා.
- ධීවර ප්‍රජාවට අවශ්‍ය ඉන්ධන නොඅඩුව ලබාදීමට කටයුතු කරනවා - ධීවර අමාත්‍යවරයා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සහතික වෙයි.
- මහජන පෙත්සම් කාරක සභාවේ සභාපති ධුරයට ගරු ජගත් පුෂ්පකුමාර මහතා යළිත් පත්වෙයි.
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා "ජාතික කාන්තා කොමිෂන් සභාවක්".

## පුවත්

- විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ වැඩි ඡන්දයෙන් සම්මත වේ.
- අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහලේකම් පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා හමුවෙයි.
- නිවැරදි තොරතුරු සෘජුව ලබා ගනිමින් මූල්‍ය කටයුතු අධීක්ෂණය සඳහා නව අයවැය කාර්යාලයක්.
- මෙරට ප්‍රංශ තානාපතිවරයා කථානායකවරයා හමුවෙයි.
- ඉන්දීය මහකොමසාරිස්වරයා කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවෙයි.

## විශේෂාංග

*තොරතුරු පනතේ ක්‍රියාකාරීත්වය (2017 - 2021) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආශ්‍රයෙන් සාකච්ඡා කිරීම*
01 කොටස

## කවරයේ කතාව



# මෙතෙක් පාර්ලිමේන්තුව නැරඹීම සඳහා මහජනතාවට පනවා තිබූ සීමාවන් ලිහිල් කෙරේ....

කොවිඩ් තත්ත්වය සහ ආරක්ෂක හේතූන් මත මෙතෙක් පැවති පාර්ලිමේන්තුව නැරඹීම සදහා පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද වේත්‍රධාරීවරයා විසින් කරන ලද යෝජනාවට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමතිය මේ මස 14 වැනිදා හිමිවී තිබේ.

මේ අනුව එහි මූලික පියවරක් ලෙස පාර්ලිමේන්තු රැස්වීම් නොමැති දිනවලදී පාසැල් ශිෂ්‍යයන් ඇතුළු පාර්ලිමේන්තුව නැරඹීමට ඉල්ලීම් සිදුකරන පාර්ශවයන්ට ඒ සදහා අවසර ලබා දීමට එකඟත්වය පලවී තිබේ.

ඒ අනුව, පාර්ලිමේන්තු සංකීර්ණයට සහ ගැලරිවලට ඇතුළුවීම සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක කර ඇති සීමාවන් ලිහිල් කිරීම සහ මේ මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පාසල් සිසුන්ට පාර්ලිමේන්තු සංකීර්ණය නැරඹීම සඳහා රැස්වීම් නොපැවැත්වෙන දිනවල පෙ.ව 9.30 සිට ප.ව 3.00 දක්වා (නිවාඩු දින හැර) අවසර ලබා දීම සිදු කරන බව පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා නිවේදනය කර සිටී.

පාසල් බලධාරීන් හට තම අයදුම්පත් වේත්‍රධාරී වෙත ලිපියක් මඟින්, ෆැක්ස් මඟින් (0112777473/ 0112777335) හෝ www.parliament.lk වෙබ් අඩවිය හරහා මාර්ගගතව අයදුම් කළ හැකිය.

විශ්වවිද්‍යාල ශිෂ්‍ය කණ්ඩායම්, රජයේ ලියාපදිංචි උසස් අධ්‍යාපන ආයතන සහ විදේශීය සංචාරකයින්ට ද මෙම පහසුකම ලබාගත හැකි බවද වේත්‍රධාරීවරයා දන්වා සිටී.

# පුවත්



# විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ වැඩි ඡන්දයෙන් සම්මත වේ.

2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධන කිරීම සඳහා වූ විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත තෙවැනි වර කියවීම ඡන්ද විමසීමකින් තොරව මේ මස 02 වැනිදා පාර්ලිමේන්තුවේදී සම්මත විය.

මෙහිදී විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම පාර්ලිමේන්තුවේ වැඩි ඡන්ද 115කින් සම්මත වූ අතර මීට පක්ෂව ඡන්ද 120 ක් ද විපක්ෂව ඡන්ද 05ක් ද හිමි විය. එසේම 43 දෙනෙක් ඡන්දය දීමෙන් වැලකී සිටියහ.

ජාතික ජන බලවේගය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර කුමාර  දිසානායක මහතා මෙසේ විසර්ජන විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සඳහා ඡන්ද විමසීමක් ඉල්ලා සිටි අතර ඒ අනුව ඡන්ද විමසීම පැවැත්වුණි.

ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා , මුදල්,ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යවරයා ලෙස 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධන කිරීම සඳහා වූ විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවනවර කියවීමේ සමාරම්භක කථාව පසුගිය අගෝස්තු 30 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්වුණි.

# අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහලේකම් පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා හමුවෙයි.

අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහලේකම් මාර්ටින් චොන්ගොන් මහතා සහ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිලධාරිනී ලෝරන්ස් මර්සාල් මහත්මිය මේ මස 12 වැනිදා පාර්ලිමේන්තුවේදී කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවූහ. මහජන සහභාගීත්වය සහිත ශක්තිමත් ආංශික අධීක්ෂණ කාරක සභා පිහිටුවීම ඇතුළු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මෑත කාලීනව ගත් වඩාත් සාධනීය පියවරයන් පිළිබඳව මෙහිදී කථානායකවරයා මාර්ටින් චොන්ගොන් මහතාට කරුණු පැහැදිලි කළේය.

ජාතික අවශ්‍යතා සඳහා ප්‍රතිපත්තිමය සහ ප්‍රමුඛත්වය ලබාදිය යුතු කරුණු කෙරෙහි මග පෙන්වීමට පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ සහභාගීත්වයෙන් පාර්ලිමේන්තු ජාතික සභාවක් පිහිටුවීමට අපේක්ෂා කරන බවද මෙහිදී කථානායකවරයා පැවසීය. තවද, සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීමේ අවශ්‍යතාව කථානායකවරයා අවධාරණය කළේය. ඊට අමතරව මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම සහ 22 වැනි සංශෝධනය පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

ජනතාවගේ අවශ්‍යතා සහ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට බලධාරීන් ගන්නා උත්සාහය ද අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහලේකම්වරයාගේ පැසසුමට ලක්විය. ජාතික දේශපාලනික කරුණුවලදී තරුණ ප්‍රජාවගේ , කාන්තාවන්ගේ සහ අනෙකුත් විශේෂ අවශ්‍යතා සහිත කණ්ඩායම්ද සහභාගී කරවා ගැනීමේ වැදගත්කම මාර්ටින් චොන්ගොන් මහතා මෙහිදී අවධාරණය කළේය.

මහා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තු ක්‍රමයට සමාන විනිවිදභාවයකින් යුත් ශක්තිමත් මාධ්‍ය ආවරණයක් සහිතව පාර්ලිමේන්තුව මහජනතාවට විවෘත කිරීම ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට ඉවහල්වන බව පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතා මෙහිදී ප්‍රකාශ කළේය. එම අදහස අනුමත කරමින් අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහලේකම්වරයා වැඩිදුරටත් කියා සිටියේ පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම වැදගත් බවත් නිවැරදි තොරතුරු එලෙසින්ම මහජනතාවට සමීප කිරීමට ජනමාධ්‍ය වගකීමෙන් ක්‍රියා කළ යුතු බවත්ය.







ගරු කථානායකවරයාගේ මවගේ අභාවය වෙනුවෙන් අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහලේකම්වරයා සිය ශෝකය ද මෙහිදී පළ කළේය.

පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම සඳහා නිරතුරුව එක්ව කටයුතු කරන බවටද ඔහු සහතික විය. ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා අග්‍රාමාත්‍යවරයාව සිටියදී සිදුකරන ලද ආරාධනාවකට අනුව අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහලේකම්වරයා මේ මස 11 වැනිදා මෙරටට පැමිණියේය.

# නිවැරදි තොරතුරු සෘජුව ලබා ගනිමින් මූල්‍ය කටයුතු අධීක්ෂණය සඳහා නව අයවැය කාර්යාලයක්

## - පාර්ලිමේන්තු මහලේකම්වරයා පවසයි-

ආදායම වියදම ඇතුළු රාජ්‍ය මූල්‍ය පාලනයට අදාළ නිවැරදි තොරතුරු සෘජු ලෙස ලබා ගනිමින් එම මූල්‍ය කටයුතු අධීක්ෂණය සඳහා වෙනම අයවැය කාර්යාලයක් පාර්ලිමේන්තුව තුළ පිහිටුවීමට ඉදිරියේදී පියවර ගන්නා බව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා මේ මස 15 වැනිදා පැවසීය.

සැප්තැම්බර් 15 වැනිදාට යෙදුණු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ජාත්‍යන්තර දිනයට සමගාමීව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය එක්ව ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයේ (**National Democratic Institute /NDI** ) අනුග්‍රහය මත සංවිධානය කළ විශේෂ මහජන සේවා වැඩසටහනකදී ඒ මහතා මේ බව පවසා සිටියේය. “ප්‍රජාතන්ත්‍රවාදය සහ තරුණ ප්‍රජාවගේ භූමිකාව” යන මැයින් සංවිධානය කර තිබූ මෙම වැඩසටහන සඳහා දිවයිනේ සියලු දිස්ත්‍රික්ක නියෝජනය කරන තරුණ සමාජ ක්‍රියාකාරීහු පිරිසක් එක්ව සිටියහ.

ලොව දියුණු ප්‍රජාතාන්ත්‍රික රටවල මෙන් ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව බැංකු සහ මූල්‍ය කටයුතු පිළිබඳ කාරක සභාව ආර්ථික ස්ථායිකරණය පිළිබඳ කාරක සභාව නමින් නව කාරක සභා කිහිපයක් අලුතින් පිහිටුවීම ඇතුළු පාර්ලිමේන්තුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවරයන් පිළිබඳව ද මහලේකම්වරයා මෙහිදී කරුණු පැහැදිලි කළේය.

පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් කුෂාණි රෝහණදීර, වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු, පාර්ලිමේන්තුවේ පරිපාලන අධ්‍යක්ෂ ජී.තච්චනරාණි ප්‍රධාන හැන්සාඩ් සංස්කාරක නයනි ලොකුකොඩිකාර, ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂ සහ සන්නිවේදන අධ්‍යක්ෂ (වැඩබලන) ජනකාන්ත සිල්වා තොරතුරු පද්ධති සහ කළමනාකරණ අධ්‍යක්ෂ මහේෂ් පෙරේරා සහ ප්‍රධාන පර්යේෂණ නිලධාරී අයේෂා ගොඩගම යන මහත්ම මහත්මීහු මෙහිදී සම්පත් දායකයන් ලෙස කටයුතු කළහ.

මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදය සහ තරුණ ප්‍රජාවගේ භූමිකාව නීති සම්පාදනය ඇතුළු පාර්ලිමේන්තු කටයුතු, ස්ථාවර නියෝග පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ කාර්යභාරය ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ තරුණ තරුණියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැති අතර සිංහල සහ දමිළ යන මාධ්‍ය ද්විත්වයෙන්ම වැඩසටහන පවත්වන ලදී.

ඊට අමතරව මෙම තරුණ තරුණියන් සඳහා පාර්ලිමේන්තු පරිශ්‍රයේ විශේෂ නැරඹුම් චාරිකාවක්ද සංවිධානය කර තිබිණි.









## මෙරට ප්‍රංශ තානාපතිවරයා කථානායකවරයා හමුවෙයි

සේවා කාලය අවසන් කර දිවයිනෙන් පිටත්ව යාමට නියමිත ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති එරික් ලැවර්ටු මහතා මේ මස 27 වැනිදා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවිය.

පාර්ලිමේන්තු පරිශ්‍රයේ පැවති මෙම හමුවට මෙරට ප්‍රංශ නියෝජ්‍ය තානාපති ඔරෙලියන් මැලට් මහතාද පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතාද එක්ව සිටියහ.





## ඉන්දීය මහකොමසාරිස්වරයා කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවෙයි



ඉන්දීය මහකොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා මේ මස 07 වැනිදා පාර්ලිමේන්තුවේදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවිය.

පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතාද මේ අවස්ථාවට එක්ව සිටියේය.

මෙම හමුවේදී දෙරට අතර සංචාරක සබඳතා වර්ධනය කිරීම සහ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම පිළිබඳව සාකච්ඡා විය. තවද ඉන්දීය රජය නිරතුරුව ශ්‍රී ලංකාවට ලබා දෙන සහාය පිළිබඳව කථානායකවරයා ස්තූතිය පළ කළ අතර ද්වීපාර්ශවීය සබඳතා විවිධ අංශවලින් තවදුරටත් වර්ධනය කර ගැනීම පිළිබඳව ද සාකච්ඡා කෙරිණි.





## පාර්ලිමේන්තු විදු පියසෙන්

# පාර්ලිමේන්තුව මහජනතාවට විවෘත කෙරේ











කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොටගෙන මහජනතාවට පාර්ලිමේන්තුව නැරඹීම සඳහා පනවා තිබූ සීමාවන් මේ වන විට සීමා සහිතව ඉවත් කොට තිබේ.
ඒ අනුව මේ මස 20 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි පාසල් සිසුන්ට පාර්ලිමේන්තු සංකීර්ණය නැරඹීම සඳහා රැස්වීම් නොපැවැත්වෙන දිනවල පෙ.ව 9.30 සිට ප.ව 3.00 දක්වා අවසර ලබාදී තිබේ.

පාර්ලිමේන්තුව නැරඹීම සඳහා විශාල උද්‍යෝගයක් මහජනතාව අතර ඇති බව පසුගිය දින කිහිපය තුළ ඒ සඳහා ලැබී තිබුණු ඉල්ලීම් විශාල සංඛ්‍යාවෙන් තහවුරු වේ.
මේ වන විට විශ්වවිද්‍යාල ශිෂ්‍ය කණ්ඩායම්, රජයේ ලියාපදිංචි උසස් අධ්‍යාපන ආයතන සහ විදේශීය සංචාරකයින් ආදී පිරිස් පාර්ලිමේන්තුව නැරඹීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කොට තිබේ.

ඒ අනුව අද මේ මස 26 වැනිදා කොළඹ කාන්තා විද්‍යාලයේ සිසුවියන් සියයකට අධික පිරිසක් අධ්‍යයන චාරිකාවක් සඳහා පාර්ලිමේන්තු සංකීර්ණය වෙත පැමිණියහ.

කොවිඩ් වසංගතය හේතුකොටගෙන 2020 මාර්තු මාසයේ සිට පාර්ලිමේන්තුව නැරඹීම සඳහා මහජනතාව වෙත පනවන ලද සීමාවන් පසුගිය 20 වැනිදා ලිහිල් කිරීමෙන් පසු පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණි පළමු සිසු කණ්ඩායම වන්නේ කොළඹ කාන්තා විද්‍යාලයේ සිසුවියන්ය. මෙම අධ්‍යයන චාරිකාවේදී සිසුවියන්ට මහජන ගැලරියේ සිට පාර්ලිමේන්තු සභා ගර්භය නැරඹීමට අවස්ථාව ලද අතර එහිදී සභාගර්භය පිළිබඳ දැනුවත් කිරීමද සිදුවිය. එයට අමතරව සෙංකෝලය, සභා ගර්භයට මෙපිටින් ඇති ආලේඛ්‍ය චිත්‍ර සහ පාර්ලිමේන්තු සභා ගර්භයට පිවිසෙන රිදී දොරටුවද නරඹා දැනුවත් වීමේ අවස්ථාවද සිසුවියන් වෙත හිමි විය.

# පාර්ලිමේන්තු ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කොළඹ ආනන්ද විද්‍යාලයේදී

පාර්ලිමේන්තු ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කොළඹ ආනන්ද විද්‍යාලයීය සියවස් සැමරුම් ශාලාවේදී මේ මස පැවැත්වුණි. කොළඹ ආනන්ද විද්‍යාලයේ උසස්පෙළ ශිෂ්‍යයන්ගේ දේශපාලන විද්‍යා විෂය පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

කොළඹ ආනන්ද විද්‍යාලයීය දේශපාලන විද්‍යා සංගමයේ විද්‍යාර්ථීන් විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන සඳහා එම විදුහලේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සභිකයන් සහ ආරාධිත පාසල්වල ශිෂ්‍යයන්ද සහභාගී වූහ.


එහිදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මිය විසින්, "ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තුව, සංක්ෂිප්ත ප්‍රවේශයක්" මැයෙන් දශක ගණනක සිය පාර්ලිමේන්තු සේවා අත්දැකීම් පාසල් ශිෂ්‍ය ප්‍රජාව සමඟ බෙදා ගන්නා ලදී.

"පාර්ලිමේන්තු කාරක සභා සහ අනාගත පුරවැසියාගේ දායකත්වය" මාතෘකාව යටතේ පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ ජයතිලක මහතා සිය දේශනය සිදුකළ අතර "ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට හැඳින්වීමක්" යන මාතෘකාව යටතේ අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා) සහ වැඩබලන අධ්‍යක්ෂ (සන්නිවේදන) එච්.ඊ ජනකාන්ත සිල්වා මහතා සිය සම්පත් දායකත්වය ලබා දුන්නේය.

මෙම විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසර කිහිපය පුරා අඛණ්ඩව සිදු කරන ලද දැනුවත් කිරීම් පෙළක තවත් අදියරකි.

පාර්ලිමේන්තුවේ ක්‍රමවේදය පිළිබඳව ඔබේ දැනුවත්භාවය දියුණු කරලීම පිණිස දිවයිනේ ඕනෑම ස්ථානයක මෙවැනි වැඩසටහනක් සංවිධානය කිරීමට හෝ මාර්ගගතව පැවැත්වීමට අවශ්‍ය වේ නම් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශය ඇමතීමෙන් එම වැඩසටහන් සංවිධානය කර ගත හැකිය.













# යාපනය හින්දු විදුහලේ සිසුන් සඳහා පාර්ලිමේන්තුවෙන් විශේෂ වැඩසටහනක්


ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහනක් යාපනය හින්දු විදුහල සිසුන් සඳහා පසුගියදා මාර්ගගත තාක්ෂණය ඔස්සේ පැවැත්විණි.

මෙම වැඩසටහනයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පරිපාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජී. තට්චනරාණි මෙනවිය විසින් පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබද දේශනය සිදු කරන ලදී, ප්‍රජාතන්ත්‍රවාදය හා පාර්ලිමේන්තුව පිළිබද දේශනය ඉදිරිපත්කරන ලද්දේ පාර්ලිමේන්තු පුස්තකාලයාධිපති සියාඩ් අහමඩ් මහතා විසිනි. මහජන සේවා නිලධාරී යස්රි මොහමඩ් මහතා විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදී.

# ඉතිහාසයේ ප්‍රථම වරට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ කොළඹ විශ්ව විද්‍යාලය එක්ව පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රියා පටිපාටි පිළිබඳ පාඨමාලාවක් අරඹයි

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ කොළඹ විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව ඉතිහාසයේ ප්‍රථම වරට පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රියා පටිපාටි පිළිබඳ කෙටි පාඨමාලාවක් ආරම්භ කොට තිබේ.
මේ මස 16 වැනිදා කොළඹ විශ්ව විද්‍යාලයේදී පාඨමාලාවේ සමාරම්භක අවස්ථාව පැවති අතර එහිදී සමාරම්භක මුඛ්‍ය දේශනය පවත්වන ලද්දේ පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා විසිනි.
කොළඹ විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ අවසන් වසර විද්‍යාර්ථීන්ගේ අධ්‍යයනය සඳහා ආරම්භ කරන ලද මෙම පාඨමාලාව සඳහා සම්පත් දායකත්වය සපයනු ලබන්නේ පාර්ලිමේන්තු මහලේකම්තුමා සහ පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසිනි.
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විශ්ව විද්‍යාලයක් හා එක්ව මෙවැනි ශාස්ත්‍රීය පාඨමාලාවක් ආරම්භ කරන ප්‍රථම අවස්ථාව මෙයයි.
මෙම පාඨමාලාව මඟින් ප්‍රජාතන්ත්‍රවාදය හා පාර්ලිමේන්තු ක්‍රමවේදය, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශය, පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය, පාර්ලිමේන්තුව හා මහජනතාව, මන්ත්‍රීවරයන් සඳහා වන චර්යාධර්ම, ස්ථාවර නියෝග, මහජන සේවා ක්‍රියාවලිය සඳහා සහසම්බන්ධ වීම, කාන්තා නියෝජනය, වැනි විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව විද්‍යාර්ථීන්ට අවබෝධය ලබා දීමට නියමිය. පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රියා පටිපාටි පිළිබඳ කෙටි පාඨමාලාව සඳහා දේශනමාලා හතරක් ද පාර්ලිමේන්තු අධ්‍යයන චාරිකාවක් ද ඇතුළත් වේ.













පාඨමාලාවෙහි සමාරම්භක අවස්ථාව සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී කරුණාරත්න කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලසන්ත මානවඩු දේශපාලන සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ අංශාධිපති ආචාර්ය ප්‍රදීප් පීරිස් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්ම දිසානායක යන මහත්වරු සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර සහකාර මහලේකම් ටිකිරි කේ ජයතිලක සහ අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායකසේවා සහ වැඩබලන අධ්‍යක්ෂ සන්නිවේදන එච්.ඊ ජනකාන්ත සිල්වා යන මහත්ම මහත්මීහු එක්ව සිටියහ.
මෙම පාඨමාලාව සඳහා කොළඹ විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සම්බන්ධීකරණය කරනු ලබන්නේ පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසිනි.

# පළාත් පාලන ආයතන මන්ත්‍රීවරියන් ඇතුළු සිවිල් ක්‍රියාකාරී නායිකාවෝ සියයක් පාර්ලිමේන්තුවට









දැනට පළාත් පාලන නියෝජනය කරන මන්ත්‍රීවරියන් සහ සිවිල් ක්‍රියාකාරී නායිකාවන් සියයකට ආසන්න ප්‍රමාණයක් සඳහා විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් පසුගිය 12 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්විණි.

දේශපාලනය තුළ කාන්තා සහභාගීත්වය සහ දැනුවත්බව වැඩි දියුණු කිරීමේ අරමුණින් පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව සංවිධානය කරන ලද මෙම වැඩසටහන සඳහා විරුද්ධ පාර්ශවයේ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා ද සහභාගී විය.

පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් කුෂාණි රෝහණදීර ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂ සහ සන්නිවේදන අධ්‍යක්ෂ (වැඩබලන) ජනකාන්ත සිල්වා, පාර්ලිමේන්තුවේ පරිපාලන අධ්‍යක්ෂ ජී. තච්චනරාණි වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු, පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි, පාර්ලිමේන්තුවේ මාධ්‍ය කළමණාකරු නිම්මි හාතියල්දෙණිය සහ මහජන සේවා කළමනාකරු බුද්ධිනී රාමනායක යන මහත්ම මහත්මීහු මෙහිදී සම්පත් දායකයන් ලෙස කටයුතු කළහ.

මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළ කාන්තාවගේ භූමිකාව, නීති සම්පාදනය ඇතුළු පාර්ලිමේන්තු කටයුතු ස්ථාවර නියෝග පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ කාර්යභාරය ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැති අතර සිංහල සහ දමිළ යන මාධ්‍ය ද්විත්වයෙන්ම වැඩසටහන පවත්වන ලදී.

ඊට අමතරව පාර්ලිමේන්තු පරිශ්‍රයේ විශේෂ නැරඹුම් චාරිකාවක්ද සංවිධානය කර තිබිණි.

ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය ( **National Democratic Institute / NDI**) අනුග්‍රහය දක්වන ලද මෙම වැඩසටහනට පැෆරල් සංවිධානය ද සම්බන්ධීකරණයෙන් දායකත්වය ලබා දී ඇත.






# කාරක සභා පුවත්













# ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සහභාගීත්වයෙන් පැවති ජාතික සභාවේ මංගල රැස්වීමේදී ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික ස්ථායීකරණයට අදාළ අනුකමිටු දෙකක් පිහිටුවීමට තීරණය කෙරේ






ජාතික සභාවේ මංගල රැස්වීමේදී අනු කමිටු දෙකක් පත් කිරීමට තීරණය කර තිබේ. ඒ කෙටි මධ්‍යම සහ දීර්ඝ කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා මඟ පෙන්වීමට අදාළව පාර්ලිමේන්තුවේ පොදු ප්‍රමුඛතා නියම කිරීමට මෙන්ම ආර්ථික ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන පොදු අවම වැඩසටහන් සම්බන්ධයෙන් එකඟතාවය ඇති කර ගැනීමටය.

මෙම තීරණ ගනු ලැබුවේ කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 29 වැනිදා පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවති ජාතික සභාවේ පළමු රැස්වීමේදී ය. මෙම රැස්වීමට අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා සභානායක අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා මෙන්ම විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතාද අමාත්‍ය ටිරාන් අලස් රාජ්‍ය අමාත්‍ය ශිවනේෂතුරෙයි චන්ද්‍රකාන්තන් එසේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අසංක නවරත්න, රවුෆ් හකීම් , රිෂාඩ් බදියුදීන් ,මනෝ ගනේෂන් ,පලනි දිගම්බරම් ,ජීවන් තොන්ඩමන්, සිසිර ජයකොඩි ,නාමල් රාජපක්ෂ , ජොන්ස්ටන් ප්‍රනාන්දු ,සාගර කාරියවසම්, අලි සබ්‍රි රහීම් ,රෝහිත අබේගුණවර්ධන ,වජිර අබේවර්ධන සහ චම්පික රණවක ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු රැසක් එක්ව සිටියහ පාර්ලිමේන්තු මහ ලේකම් ධම්මික දසනායක මහතාද මෙම කාරක සභාවට සහභාගී විය.

අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා මේ මස 20 වැනිදා ජාතික සභාව ස්ථාපිත කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර බෙදීමකින් තොරව එය සම්මත විය. ඒ අනුව දැනට නම් ලබා දී ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ලේඛනය කතානායකවරයා විසින් මේ මස 23 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි.

ජාතික සභාවේ පළමු රැස්වීමෙන් අනතුරුව අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා කියා සිටියේ ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේද සාමාජිකයින් ජාතික සභාවේ රැස්වීමට පැමිණ සිටි බවයි මෙම සුබදායී පණිවුඩය ජාතික වශයෙනුත් පාර්ලිමේන්තු වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යාම සඳහාත් ජනතාව හා පාර්ලිමේන්තුව අතර ඇති විශ්වාසය තව දුරටත් තහවුරු වීම සඳහාත් විවෘත කෙරුණු අලුත් දොරටුවක් බවද ඔහු පැවසීය.

සෑම පාර්ලිමේන්තු සතියකම බ්‍රහස්පතින්දා ජාතික සභාව රැස්වීමට ද මෙම රැස්වීමේදී තීරණය වී තිබේ.




## අමාත්‍යාංශ ලේකම්වරු තිදෙනෙක් සහ තානාපතිවරයෙකුගේ පත් කිරීම සඳහා උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමතිය...

අමාත්‍යාංශ ලේකම්වරුන් තිදෙනෙකුගේ සහ තානාපතිවරයෙකුගේ පත් කිරීම් සඳහා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමතිය මේ මස 20 වැනිදා හිමි වූ බව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.

ඒ අනුව, ජපානයේ නව ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස රොඩ්නි මනෝරන්ජන් පෙරේරා මහතා පත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව අනුමතිය ලබාදී තිබේ.

මේ අතර, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස බී.එල්.ඒ .ජේ ධර්මකීර්ති මහතාගේ පත්කිරීමට ද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස පී.එච්.සී රත්නායක මහතාගේ පත්කිරීමට ද මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස එස්. හෙට්ටිආරච්චි මහතා පත් කිරීමටද උසස් නිලතල පිළිබඳ කාරක සභාව අනුමතිය ලබාදී තිබේ.

මීට අමතරව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපතිවරයා ලෙස එල්.එච්. රංජිත් සේපාල මහතාගේ පත් කිරීමටද ලංකා විදුලි පුද්ගලික සමාගමේ (LECO) සභාපතිවරයා ලෙස අතුල ප්‍රියදර්ශන ද සිල්වා මහතා මහතාගේ පත්කිරීමටද ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස නිශාන්ත රණතුංග මහතාගේ පත් කිරීමටද කාරක සභාවේ අනුමතිය හිමිව තිබේ.






## ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරයට අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා පත්වෙයි

නව වැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයට අදාළව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ නව සභාපති වශයෙන් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු (ආචාර්ය) විජේදාස රාජපක්ෂ මහතා මේ මස 21 වැනිදා ඒකමතිකව තේරී පත්විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන සහ 2022 අගෝස්තු 10 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා තේරීම් කාරක සභාව විසින් සාමාජිකයන් නම්කරන ලදී.

මේ අනුව මෙම කාරක සභාවේ සෙසු මන්ත්‍රීවරු ලෙස ගරු ඩිලාන් පෙරේරා, ගරු ඩලස් අලහප්පෙරුම, ගරු වාසුදේව නානායක්කාර, ගරු කබීර් හෂීම්, ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර, ගරු තලතා අතුකෝරල, ගරු කනක හේරත්, ගරු විජිත බේරුගොඩ, ගරු තාරක බාලසූරිය, ගරු අනුරාධ ජයරත්න, ගරු ජී. ජී. පොන්නම්බලම්, ගරු හේෂා විතානගේ, ගරු කෝකිලා ගුණවර්ධන, ගරු වීරසුමන වීරසිංහ සහ ගරු සමන්ප්‍රිය හේරත් යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම සඳහා පාර්ලිමේන්තු සභාවේ අනුමතිය



සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තු සභාව වෙත ඉදිරිපත් කරන ලද නාමයෝජනා සඳහා එම සභාවේ අනුමතිය හිමිවී තිබේ. ඒ අනුව කේ. ඒච්. ජෙසී මුවිලර් මහත්මිය සහ කේ. දුනුසිංහ මහතාගේ නාමයෝජනා සඳහා මෙසේ අනුමතිය හිමිවූ බව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.

එයට අමතරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩුව පවතින සාමාජික ධුරය සඳහා පත්කිරීට ඒ එ මී නහියා මහතාගේ නාමයෝජනාව ගරු ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීමටද පාර්ලිමේන්තු සභාව විසින් තීරණය කරන ලද බවද මහලේකම්වරයා සඳහන් කළේය. පාර්ලිමේන්තු සභාව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 07 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අතර එහිදී මෙම තීරණ ගනු ලැබිණි එම රැස්වීමට අග්‍රාමාත්‍ය ගරු දිනේශ් ගුණවර්ධන සහ අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද යන මහත්වරු ද එක්ව සිටියහ.

## දේශීය සිනමාවේ අභිවෘද්ධිය උදෙසා පාර්ලිමේන්තු කාරක සභාවක් පිහිටුවන්නැයි මන්ත්‍රීවරයන්ගෙන් කථානායකතුමාට ඉල්ලීමක්

දේශිය චිත්‍රපට කර්මාන්තය මුහුණ දී තිබෙන තත්ත්වය පිළිබඳව සහ එහි ව්‍යාපාර මූලධර්මයන්ද යළි ස්ථාපනය කිරීම ප්‍රමුඛතා ලේඛනයක් සැකසීම, ප්‍රේක්ෂක ආකර්ෂණය 1971 - 1979 කාලය තුළ මෙන් යළි ස්ථාපිත කිරීම ආදී කරුණු සලකා බැලීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පිහිටුවන ලෙස ඉල්ලීමේ ලිපියක් මේ මස 23 වැනිදා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා වෙත භාර දෙන ලදී.

සාම්ප්‍රදායික චිත්‍රපටකරණය වෙනුවට ඩිජිටල්කරණය ලබා ඇති ප්‍රගතිය අනුව දේශිය චිත්‍රපට නිෂ්පාදනය සහ පසු නිෂ්පාදනය ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය සාධකයක් බව පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරයන් ගණනාවකගේ අත්සනින් යුතුව භාරදී ඇති මෙම ලිපියේ සඳහන් වේ පාසැල් අධ්‍යාපනය නිමකරන සිනමා ක්ෂේත්‍රයට පිවිසීමට කැමැත්තක් හා දක්ෂතාවයක් දක්වන තරුණ පරපුරට පූර්ණ කාලීන රාජ්‍ය අනුග්‍රහය ඇති සිනමා පාසලක් බිහිකිරීම රාජ්‍ය ප්‍රතිපත්තියට ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය බවද ලිපියේ තවදුරටත් දැක්වේ.

වෙනත් වෘත්තිකයන් බිහි කිරිම සඳහා විශ්ව විද්‍යාල ඇතත් සිනමාව සහ ටෙලිවිෂන් මාධ්‍ය පූර්ණ කාලීනව හැදෑරීම සඳහා මෙරට විශ්ව විද්‍යාලයක් නොමැති වීමේ  අඩුපාඩුව ලිපියේ අවධාරණය කෙරේ.

ජාත්‍යන්තරව චිත්‍රපට නිෂ්පාදනය හා බෙදාහැරීම සිනමා ශාලාවට අමතරව වෙනත් ඩිජිටල් මාධ්‍ය ඔස්සේ NETFLIX,PRIME VIDEO,ඇතුළු අනෙකුත් OTT PLATFORMS වල ප්‍රදර්ශනය සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේදයන් එම සමාගම් සමග පූර්ව ගිවිසුම් ඇති කර ගැනීම පිළිබඳව ද කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ සහ නිර්දේශයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකි  විශේෂ කාරක සභවක් පත් කරන ලෙස ලිපිය මගින් කථානායකතුමාගෙන් ඉල්ලා තිබේ.



# පාර්ලිමේන්තුවේ සභාපති නාමාවලිය සඳහා මන්ත්‍රීවරයන් නම් කෙරේ

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 140 අනුව නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සභාපති නාමාවලියට ඇතුළත් කිරීමට ගරු කථානායකවරයා නම් කර තිබෙන බව නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා මේ මස 20 වැනිදා පාර්ලිමේන්තුවට නිවේදනය කළේය මෙම පත් කිරීම්

ඒ අනුව,


ගරු වේලු කුමාර් මහතා,
ගරු මයන්ත දිසානායක මහතා,
ගරු ඉම්රාන් මහරූෆ් මහතා,
ගරු හර්ෂණ රාජකරුණා මහතා,
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,
ගරු හේෂා විතානගේ මහතා,
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,
ගරු මධුර විතානගේ මහතා,
ගරු වීරසුමන වීරසිංහ මහතා,
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

සභාපති නාමාවලිය සඳහා නම් කොට තිබේ.
















# ආර්ථික අර්බුදය පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සකස් කිරීමට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී යෝජනා වෙයි





වත්මන් ආර්ථික අර්බුදයේ ස්වරූපය පිළිබඳ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට රජයේ මුදල් පිළිබද කාරකසභාවේ මූලිකත්වයෙන් වැඩසටහන් මාලාවක් සකස් කළ යුතු බව එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරන ලදී.

මේ පිළිබඳව යෝජනා වූයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 06 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙහිදී පසුගිය ජූලි 27 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ "2022 - වසර මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව" සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ ලේකම් මහින්ද සිරිවර්ධන මහතා ඇතුළු නිලධාරීන් විසින් ඉදිරිපත් කිරීමක් සහිතව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් දැනුවත් කරන ලදී. මෙම දැනුවත් කිරීමේදී පැහැදිලි වූ විවිධ කරුණු හේතුවෙන් මෙසේ වත්මන් ආර්ථික අර්බුදය පිළිබඳ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දැනුවත් කිරීමට යෝජනා විය.

මේ අනුව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා පෙන්වා දුන්නේ උද්ධමනය ඉහළ යාම සමග පොලී අනුපාතය ඉහළ යා හැකි බවයි. මේ නිසා පළමු වැඩසටහන ලෙස උද්ධමනය සහ පොලී අනුපාතය අතර ඇති සම්බන්ධය පිළිබඳ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දැනුවත් කිරීමට තමා යෝජනා කරන බව හෙතෙම පැවසීයි එසේම පක්ෂ විපක්ෂ බේදයකින් තොරව සියලු මන්ත්‍රීවරුන් මේ සඳහා සම්බන්ධවීමේ අවශ්‍යතාවද ඒ මහතා පෙන්වා දුන්නේ ය.

තවද මෙහිදී 2019 වර්ෂයේ අග භාගයේදී බදු ප්‍රතිශත අඩු කිරීම නිසා රාජ්‍ය ආදායම අඩු වීම පිළිබඳව ද මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා විය . එසේම රාජ්‍ය ආදායම අඩු වීමට කොවිඩ් වසංගතයේ බලපෑම සිදු වූ ආකාරය පිළිබඳව ද මෙහිදී සාකච්ඡා වුණු අතර 2022 වර්ෂය වන විට රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමට ගෙන ඇති පියවර පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය.







# අමාත්‍යාංශයීය උපදේශක කාරකසභා 09ක් සඳහා සාමාජිකයන් පත් කෙරේ

අමාත්‍යාංශයීය උපදේශක කාරකසභා 09ක් සඳහා සාමාජිකයන් පත් කරන ලද බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ මස 06 වැනිදා පාර්ලිමේන්තුවට නිවේදනය කළේය.

ඒ අනුව ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා ගරු අනුර දිසානායක මහතා, ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා, ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා, ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා සහ ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා යන මන්ත්‍රීවරයන් පත්කොට තිබේ.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සඳහා පත් කරන ලද මන්ත්‍රීවරයන් වන්නේ ගරු කබීර් හෂීම් මහතා, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා, ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා සහ ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතායි.

එමෙන්ම වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සඳහා සාමාජිකයන් ලෙස ගරු තිස්ස අත්තනායක මහතා, ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා, ගරු කේ. කාදර් මස්තාන් මහතා, ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා සහ ගරු හේෂා විතානගේ මහතා පත් කොට තිබේ.

එයට අමතරව ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා ගරු කබීර් හෂීම් මහතා, ගරු දිලුම් අමුණුගම මහතා, ගරු කනක හේරත් මහතා, ගරු අශෝක් අබේසිංහ මහතා සහ ගරු ලලිත් වර්ණ කුමාර මහතා පත් කොට තිබේ.

ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට පත් කළ සාමාජිකයන් වන්නේ ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා ගරු ශාන්ත බණ්ඩාර මහතා ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය ගරු එස් එම් මරික්කාර් මහතා සහ ගරු සංජීව එදිරිමාන්න මහතාය.

එමෙන්ම කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සඳහි පත් කළ මන්ත්‍රීවරයන් වනනේ ගරු ආර්.එම් රංජිත් මද්දුම බණ්ඩාර මහතා ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා ගරු උදයකාන්ත ගුණතිලක මහතා ගරු කුලසිංහම් තිලීපන් මහතා සහ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතාය.

අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා ගරු තලතා අතුකෝරල මහත්මිය ගරු එච් එම් එම් හරීස් මහතා, ගරු සිසිර ජයකොඩි මහතා ගරු ජී. ජී පොන්නම්බලම් මහතා සහ ගරු අනුප පස්කුවල් මහතා පත් කොට තිබේ.

විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සඳහා ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය ගරු දුමින්ද දිසානායක මහතා ගරු කබීර් හෂීම් මහතා ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා සහ ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා පත් කොට තිබේ.

කම්කරු හා විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා ගරු ජෝන් සෙනෙවිරත්න මහතා ගරු වඩිවේල් සුරේෂ් මහතා ගරු ඩී බී හේරත් මහතා ගරු වේලු කුමාර් මහතා සහ ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා පත් කොට තිබෙන බවද කථානායකතුමා නිවේදනය කළේය.



# පවත්නා ආර්ථික අර්බුදය හේතුවෙන් වැඩිම පීඩාවට ලක් වී සිටින්නේ රටේ දරුවන්

## ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිණී කවිරත්න



පවත්නා ආර්ථික අර්බුදය හේතුවෙන් වැඩිම පීඩාවට ලක් වී සිටින්නේ මෙරට දරුවන් බව පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිණී කවිරත්න මහත්මිය පැවසුවාය.

ඒ මහත්මිය මේ බව පැවසුවේ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපති ධුරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහිණී කවිරත්න මහත්මිය පත් කිරීමෙන් අනතරුවයි.

ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපති ධුරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහිණී කවිරත්න මහත්මිය පත් කරන ලද්දේ ගරු උදය ගම්මන්පිල සහ කිංස් නෙල්සන් යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ යෝජනා ස්ථිරත්වයෙනි.

එමෙන්ම, සංසදයේ සම උපසභාපති ධුරය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පත් කරන ලද්දේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු රෝහිණී කවිරත්න මහත්මිය සහ කිංස් නෙල්සන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙනි.

සංසදයේ සම උප සභාපති ධුරයට පත් අනෙක් මන්ත්‍රීවරයා වූයේ ගරු වේලුකුමාර් මහතායි. ඒ මහතාගේ නම යෝජනා ස්ථිර කරන ලද්දේ ගරු කිංස් නෙල්සන් සහ ගරු අශෝක් අබේසිංහ යන මහත්වරුන් විසිනි

ඉහත පත්වීම් සිදු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ දරුවන්ට යහපත් හෙට දවසක් උදාකර දීම සඳහා අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතන සම්බන්ධ කර ගනිමින් රටේ දරුවන් සම්බන්ධ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා පිහිටුවා ඇති ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදය මේ මස 21 වැනි දා නවවැනි පාර්ලිමේන්තුව සඳහා ප්‍රථම වතාවට රැස්වූ අවස්ථාවේදීය.

රැස්වීම ආරම්භ කරමින් සංසදයේ ලේකම් පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය සඳහන් කළේ හත්වැනි පාර්ලිමේන්තුවේදී ආරම්භ කරන ලද ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදය අටවැනි පාර්ලිමේන්තුවේදීත් සාර්ථකව ක්‍රියාත්මක වූ බවයි

දරුවන්ගේ යහපැවැත්ම උදෙසා ප්‍රතිපත්ති වෙනස් කිරීම් හෝ නව ප්‍රතිපත්ති හඳුන්වාදීම සහ සියලුම දරුවන්ගේ යහපැවැත්මට අදාළ ප්‍රතිපත්ති නිතිපතා සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම ළමුන් සඳහා වැඩ කරන විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන සමග සම්බන්ධීකරණය කිරීම මෙන්ම දරුවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව රාජ්‍ය ආයතනවල සහ මහජනතාවගේ වැඩි අවධානයක් යොමු කිරීමද මෙම සංසදයේ මූලික අරමුණු බවද නියෝජ්‍ය මහලේකම්වරිය සඳහන් කළාය.

රැස්වීමට සහභාගී වූ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා සඳහන් කළේ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදය සමග ඉදිරියට කටයුතු කිරීමට තමා බලාපොරොත්තු වන බවයි.

# මැයි 9 ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට අදාළ විශේෂ කමිටු වාර්තාව ඉදිරියේ දී පාර්ලිමේන්තුවට - ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

**■ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට අපරාධකරුවන් ගෙන්වා ගැනීමට පවතින නෛතික බාධාවන් ඉවත් කිරීමට අදාළ නියමයටත් අනුමතිය**





මැයි 9 වැනිදා සහ ඊට ආසන්න දිනවලදී මෙරට සිදුවූ ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට අදාළ විශේෂ කමිටු වාර්තාව පසුගිය 8 වැනිදා ජනාධිපතිවරයාට බාර දුන් බවත් ඒඅනුව ඉදිරියේදී ඒ පිළිබදව කැබිනට් මණ්ඩලය සහ පාර්ලිමේන්තුව දැනුවත් කිරීමට පියවර ගන්නා බවත් ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා පාර්ලිමේන්තුවේදී පැවසීය.

නව සභාවාරයට අදාළව ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ පළමු රැස්වීමේ මුලසුන හොබවමින් රාජ්‍ය අමාත්‍යවරයා මේ මස 23 වැනි දා මේ බව පැවසීය.
හිටපු නාවික හමුදාපති අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ, හිටපු ගුවන් හමුදාපති මාෂල් ඔෆ් ද එයාර්ෆෝස් රොෂාන් ගුණතිලක සහ හිටපු හමුදාපති ජෙනරල් දයා රත්නායක (විශ්‍රාමික) යන මහත්වරුන්ගෙන් සමන්විත මෙම කමිටුවේ වාර්තාව අනුව ආරක්ෂක අංශවලද යම් අඩුලුහුඩුකම් සිදුවී ඇත්නම් ඉදිරියේදී ඒ සම්බන්ධව පියවර ගන්නා බවත් රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.

මැයි 9 වැනිදා සහ ඊට ආසන්න දිනවලදී මෙරට සිදුවූ ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට අදාළව ආරක්ෂක අංශවල යම් අඩුලුහුඩුකම් සිදුවූයේද යන්නත් ඒ හා සම්බන්ධ වූ පුද්ගලයන්ට ගන්නා නීතිමය පියවර සම්බන්ධයෙන් මන්ත්‍රීවරු කාරක සභාවේ අවධානයට යොමුකළ අවස්ථාවේ අමාත්‍යවරයා මේ බව පැවසීය. එසේම ආරක්ෂක ලේකම් ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික) මහතා මෙහිදී පවසා සිටියේ මෙම ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට සම්බන්ධ වූවන්ට සහ අනුබල දුන් අයට එරෙහිව නීතිය තදින් ක්‍රියාත්මක කරන බවයි.

මේ අතර ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍ය අතර පවතින උද්ර්පණ ගිවිසුමට අදාළ අංක 2282/19 දරන ගැසට් පත්‍රයේ සඳහන් නියමය පාර්ලිමේන්තුවේ අනුමතියට ඉදිරිපත් කිරීම සඳහා ද ආරක්ෂක කටයුතු පිළිබද අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය හිමි විය. 2014 වසරේදී දෙරට අතර ඇතිකරගත් ගිවිසුමකට අනුව එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට අපරාධකරුවන් ඇතුළු අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය පුද්ගලයන් මෙරටට කඩිනමින් ගෙන්වා ගැනීමේදී ඇතිවූ නෛතික බාධාවන් ඉවත් කිරීම මෙහි අරමුණ වී ඇත.

# ධීවර ප්‍රජාවට අවශ්‍ය ඉන්ධන නොඅඩුව ලබාදීමට කටයුතු කරනවා - ධීවර අමාත්‍යවරයා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සහතික වෙයි



ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය ඉන්ධන කඩිනමින් ලබාගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවත් මේ අනුව ධීවරයින්ට දෛනිකව ඉන්ධන ලබාදීමට කටයුතු යොදා ඇති බවත් ධීවර කටයුතු අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද මහතා පාර්ලිමේන්තුවේදී පැවසීය.

අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 21 වැනිදා පැවති ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේදී අමාත්‍යවරයා මේ බව දැනුම් දුන්නේය.












එසේම මේ වසර අවසන් වන විට මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අරමුණින් හඳුනාගෙන ඇති වැව් හාරදහසක මත්ස්‍ය පැටවුන් බෝකිරීමේ කටයුතු කඩිනම් කිරීමට අපේක්ෂා කරන බව පෙන්වා දුන් අමාත්‍යවරයා ධීවර සංස්ථා අලෙවිසැල් විවිධ ප්‍රදේශවල වැඩි වශයෙන් පිහිටුවීමට පියවර ගන්නා බවද පැවසීය.

මේ අතර ඔක්තෝබර් 01 වැනිදාට යෙදෙන ලෝක ළමා දිනයට සමගාමීව ධීවර ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපනය සෞඛ්‍ය සහ සුබසාධනය නංවාලීමේ විශේෂ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට නියමිත බව ධීවර රාජ්‍ය අමාත්‍ය ගරු පියල් නිශාන්ත මහතා පැවසීය.

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග ත්‍රිත්වයක් කාරක සභාව විසින් අනුමත කරන ලදී.

## මහජන පෙත්සම් කාරක සභාවේ සභාපති ධූරයට ගරු ජගත් පුෂ්පකුමාර මහතා යළිත් පත්වෙයි



නවවැනි පාර්ලිමේන්තුවේ තුන්වැනි සභා වාරයේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජගත් පුෂ්පකුමාර මහතා යළි තේරී පත් විය.

ගරු ජගත් පුෂ්පකුමාර මහතාගේ නම යෝජනා කරන ලද්දේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රියංකර ජයරත්න මහතා විසින් වන අතර එය ස්ථිර කරන ලද්දේ ගරු වඩිවේල් සුරේෂ් මහතා විසිනි. මේ මස 01 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ පළමු රැස්වීමේදී මේ තීරණ ගනු ලැබිණි.

ගරු ජගත් පුෂ්පකුමාර මහතා නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභා වාරයේදීද මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කළේය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 (1) අනුව පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාව විසින් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සඳහා සාමාජිකයන් පසුගියදා පත් කරන ලදී.

ඒ අනුව ඒ අනුව, ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා, ගරු පියංකර ජයරත්න මහතා, ගරු දිලිප් වෙදආරච්චි මහතා, ගරු වඩිවේල් සුරේෂ් මහතා, ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා, ගරු අශෝක ප්‍රියන්ත මහතා, ගරු අ. අරවින්ද් කුමාර් මහතා, ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය, ගරු ඩී. වයි. ජී. රත්නසේකර මහතා, ගරු සාරතී දුෂ්මන්ත මහතා, ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා, ගරු ජයන්ත කැටගොඩ මහතා, ගරු මොහමඩ් මුසම්මිල් මහතා, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා, ගරු වේලු කුමාර් මහතා, ගරු වරුණ ලියනගේ මහතා, ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා, ගරු මායාදුන්න චින්තක අමල් මහතා, ගරු නිපුණ රණවක මහතා, ගරු ගාමිණී වලේබොඩ මහතා, ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය, සහ ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා යන මන්ත්‍රීවරයන් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සෙසු සාමාජිකයන් ලෙස පත් කොට තිබේ.

## ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා "ජාතික කාන්තා කොමිෂන් සභාවක්"




කාන්තා අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ක්‍රියාත්මක වන අයුරු අධීක්ෂණය සහ ඒ සම්බන්ධ ගැටලු සඳහා මැදිහත්වීමට පාර්ලිමේන්තු පනතකින් "ජාතික කාන්තා කොමිෂන් සභාව" නමින් ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම කෙරෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ අවධානය යොමුව ඇත.
ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ සභාපතීත්වයෙන් මෙ මස 02 වැනිදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය රැස්වූ අතර එහිදී ශ්‍රී ලාංකේය කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ගුණාත්මක භාවය තහවුරු කිරීමට අදාළව සංසදය වෙත ඉදිරිපත් වී ඇති යෝජනා සාකච්ඡාවට ගැනීම සිදුවිය.

රාජ්‍ය අංශයේ සේවය කරන කාන්තාවන්ට සිදුවන අසාධාරණකම් විමර්ශනය කර ඒවාට සහන සැලසීම සඳහා ඔම්බුඩ්ස්පර්සන් කාර්යාලය යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ස්වාධීන ඔම්බුඩ්ස් කාන්තාවක් පත් කිරීම පිළිබඳව ද මෙහිදී අවධානය යොමුවී ඇත. එසේම කාන්තා හා ගැහැණු දරුවන්ට සිදුවන හිංසන සිද්ධීන් කඩිනමින් විභාග කිරීම සඳහා නීති සම්පාදනය කිරීම, ආරක්ෂක අංශ සහ පොලිසිය මගින් සිදුවිය හැකි වධහිංසා පැමිණවීම්, ස්ත්‍රී දූෂණ සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ආදිය වැළැක්වීම සහතික කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ තුළ අභ්‍යන්තර අධීක්ෂණ යාන්ත්‍රණයන් ඇතුළත් කිරීමත් මෙම යෝජනා අතර වේ.

මෙවැනි පනත් කෙටුම්පතක වැදගත්කම අවධාරණය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපති ගරු වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පවසා සිටියේ පනත් කෙටුම්පත සඳහා වන යෝජනා වඩාත් ගැඹුරින් සලකා බැලිය යුතු බවයි.

# තොරතුරු පනතේ ක්‍රියාකාරීත්වය (2017 - 2021) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආශ්‍රයෙන් සාකච්ඡා කිරීම

## I කොටස




ශ්‍රී ලංකාව තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය යනු රටේ මූලික අයිතිවාසිකමකි (Fundamental Right). මෙම මූලික අයිතිය ලබා දුන්නේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14A ව්‍යවස්ථාව මඟින් 2015 මැයි 15 වන දිනය. ඉන්පසුව මෙම අයිතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මාර්ගය සැකසීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත 2016 ජුනි මස පාර්ලිමේන්තුව තුළදී සම්මත වූ අතර කථානායකතුමාගේ සහතිකය ලැබීමත් සමඟ මෙය 2016 අගෝස්තු මස 04 දින සිට ශ්‍රී ලංකාවේ නීතියක් බවට පත්විය. පාර්ලිමේන්තුවේ දී කිසිවකුගේ විරුද්ධත්වයකින් තොරව සම්මත වූ පනතක් ලෙස, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත නීති ඉතිහාසයට එක්විය. මෙය ශ්‍රී ලංකා- වේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ යහපාලනයට ලැබුණු ශක්තිමත් දායකත්වයකි.

ඒ අනුව, RTI පනත මඟින් ලබා දෙන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය නව අයිතියක් නොව, එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා ලබා දී ඇති ව්‍යවස්ථානුකූල අයිතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සැකසීමක් පමණි.

ශ්‍රී ලංකාවේ RTI පනත, ලොව අනිකුත් රටවල RTI පනත්වලට වඩා සුවිශේෂී ලක්ෂණවලින් සමන්විත වන අතර එය කොටස් 7කින් සහ වගන්ති 44කින් යුක්ත දීර්ඝ පනතකි. පනතේ අන්තර්ගතය ගැඹුරින් සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණ නොවන අතර, මෙය පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය ආශ්‍රයෙන් පසුගිය වසර 5 තුළ (2017 - 2021) RTI පනතේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සිදු කරනු ලබන විග්‍රහයකි.

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම අරභයා RTI පනත ක්‍රියාත්මක වීම උපකාරී වී තිබෙන බව මෙරට පුරවැසියන් පාර්ලිමේන්තුවේ තොරතුරු ලබා ගැනීමට දක්වා ඇති උනන්දුව මඟින් මේ වනවිට සනාථ වෙමින් තිබෙන අතර පාර්ලිමේන්තුවේ කටයුතු ජනතාවට විවෘත කිරීමට සහ සමාජගත කිරීම සඳහා මෙම පනත මඟින් විශාල පිටිවහලක් ලැබී තිබේ.

මෙම කාර්යය සඳහාම වෙන්වූ ඒකකයක් නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) ගේ අධීක්ෂණය යටතේ පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය තුළ ස්ථාපිත කර ඇති එය පාර්ලිමේන්තුවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ඒකකය (RTI UNIT) ලෙස හැඳින්වේ.

RTI පනතේ 23 (1) (අ) වගන්තිය අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තොරතුරු නිලධරයන් එක් අයෙකු හෝ වැඩි ගණනකුත් නම් කළ නිලධරයෙකුත් පත් කළ යුතුය ඒ අනුව පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ නම් කළ නිලධරයා ලෙස කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් කුෂානි ඒ රෝහණධීර මහත්මියත් තොරතුරු නිලධරයා ලෙස පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ ජයතිලක මහතාත් කටයුතු කරයි.


පසුගිය වසර 05ක පාර්ලිමේන්තුවේ තොරතුරු ඒකකයේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා දැන් අපගේ අවධානය යොමු කරමු.

## ලැබුණු තොරතුරු ඉල්ලීම්

පනතේ 24(1) වගන්තියට අනුව තොරතුරු නිලධාරියා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම හරහා තොරතුරු ලබා දීමේ ක්‍රියාවලිය ආරම්භ වේ. ඒ අනුව පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය වෙත ලැබුණු තොරතුරු ඉල්ලීම් සම්බන්ධ දත්ත 01 වැනි වගුව තුළිනුත්, මේ සම්බන්ධ වැඩිදුර පැහැදිලි කිරීමක් 01 වැනි රූපසටහන තුළිනුත් දැකගත හැක.

| ඉල්ලීම් | සංඛ්‍යාත්මකව | | | | | ප්‍රතිශතාත්මකව | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| ලැබුණු ඉල්ලීම් | 118 | 152 | 130 | 100 | 84 | 100 | 100 | 100 | 100 | 100 |
| පිළිගත් ඉල්ලීම් | 73 | 101 | 89 | 73 | 59 | 62 | 66 | 68 | 73 | 70 |
| ප්‍රතික්ෂේප කළ ඉල්ලීම් | 45 | 51 | 41 | 27 | 25 | 38 | 34 | 32 | 27 | 30 |

**01 වගුව**



මෙහිදී පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය වෙත වැඩිම තොරතුරු ඉල්ලීම් ප්‍රමාණයක් ලද වසර ලෙස 2018 වසර සැලකිය හැකි අතර සෑම වසරකදීම 60% ඉක්මවූ ඉල්ලීම් සංඛ්‍යාවකට තොරතුරු ලබාදී ඇත.


තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීම පිළිබඳව පනතේ සඳහන් වන ප්‍රතිපාදනවලට අනුව අවම වශයෙන් වැඩකරන දින 14ක සහ උපරිම වශයෙන් දින 50ක පමණ කාලයක් හිමිවන නමුත් පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය විසින් දින 10ක සාමාන්‍ය කාලයක් තුළ ඒ සඳහා පියවර ගෙන තිබෙන බව ප්‍රකාශ කළ යුතුය.

## ලද ක්‍රමවේදය

තොරතුරු ඉල්ලීම් ලද ක්‍රමවේදය පිළිබඳ දත්ත 02 වැනි වගුවෙන් සහ ඒ සම්බන්ධ විශ්ලේෂණයක් 02 වැනි රූපසටහන තුළිනුත් දැකගත හැක.

| ලද ක්‍රමවේදය | සංඛ්‍යාව | | | | | ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| සාමාන්‍ය තැපැල | 54 | 88 | 94 | 75 | 40 | 46 | 58 | 72 | 75 | 48 |
| විද්‍යුත් තැපැල | 36 | 45 | 26 | 25 | 43 | 31 | 30 | 20 | 25 | 51 |
| වෙනත් | 28 | 19 | 10 | 0 | 1 | 24 | 13 | 8 | 0 | 1 |
| | 118 | 152 | 130 | 100 | 84 | 100 | 100 | 100 | 100 | 100 |

**02 වගුව**




**02 රූපසටහන**


වෙනත් ක්‍රමවේදයකට ලද තොරතුරු ඉල්ලීම් යනු බොහෝවිට අප කාර්යාලයටම ගෙනවිත් භාර දුන් ඉල්ලීම්ය. 2021 වසරේදී විද්‍යුත් තැපෑල හරහා ලද ඉල්ලීම් 50% ඉක්මවමින් ලැබී තිබෙන අතර එය හොඳ ප්‍රවණතාවයක් ලෙස සඳහන් කළහැක. කෙසේ වෙතත් පාර්ලිමේන්තුවේ තොරතුරු ඒකකය තොරතුරු ඉල්ලීම් වෙනුවෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා විද්‍යුත් තැපෑල ඉතා ප්‍රබල ලෙස භාවිතයට ගනී.

# තොරතුරු ඉල්ලීම් ස්වභාවය අනුව වර්ගීකරණය

අප හට ලැබුණු තොරතුරු ඉල්ලීම්වල ස්වභාවය සම්බන්ධ දත්ත ඉදිරිපත් කිරීමක් පහත 03 වැනි වගුවෙන් පෙන්වා ඇති අතර 03 වැනි රූපසටහන මගින් එය වඩාත් විශ්ලේෂණාත්මකව පැහැදිලි කර ඇත.

| ඉල්ලීම් වර්ගීකරණය | සංඛ්‍යාත්මකව | | | | | ප්‍රතිශතාත්මකව | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 1 | 1 | 2 | 1 | 8 | 1 | 1 | 2 | 1 | 10 |
| ආයතනික කටයුතු | 11 | 10 | 4 | 5 | 7 | 9 | 7 | 3 | 5 | 8 |
| දේශපාලන පළිගැනීම් | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 1 |
| මූල්‍ය කටයුතු | 16 | 8 | 11 | 11 | 8 | 14 | 5 | 8 | 11 | 10 |
| පරිසර සම්බන්ධ තොරතුරු | 0 | 0 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 3 | 0 |
| ප්‍රතිපත්ති | 60 | 4 | 6 | 28 | 10 | 51 | 3 | 5 | 28 | 12 |
| වෙනත් | 30 | 129 | 107 | 51 | 50 | 25 | 85 | 82 | 51 | 60 |
| | 118 | 152 | 130 | 100 | 84 | 100 | 100 | 100 | 100 | 100 |

**03 වගුව**




**03 රූපසටහන**

2017 වසරේදී හැර අනිකුත් වසරවලදී 50% ඉක්මවමින් ඉල්ලීම් ලැබී තිබෙන්නේ "වෙනත්" යන වර්ගීකරණය යටතේ වන අතර එයට පාර්ලිමේන්තු කටයුතු සහ එහි ක්‍රියාදාමය සම්බන්ධ සියලුම තොරතුරු ඉල්ලීම් ඇතුළත් කර ඇත.

**සනත් විජේගුණවර්ධන - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී**

**විශේෂ ස්තුතිය:**
හිරුණි පුන්සරා - හැන්සාඩ් වාර්තාකරු
ශාන්ති සෞභාග්‍යා - සහකාර පර්යේෂණ නිලධාරී




# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන I 27 වැනි කාණ්ඩය I සැප්තැම්බර් 2022
ISSN 2806 – 5425

සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100  ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka  @ParliamentLK

@slparliament  Parliament of Sri Lanka